# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,226 - 2021 අප්‍රේල් මස 30 වැනි සිකුරාදා - 2021.04.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | 336 |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | — |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 337 |


*සැ. යු.*- හදිසි මහජන සෞඛ්‍ය පනත් කෙටුම්පත, 2021 අප්‍රේල් මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 මැයි මස 21 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 මැයි මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම්

## දැන්වීමයි

දෙහිඅත්තකණ්ඩිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ පැවති නඩුවලට අදාළව නඩු භාණ්ඩ වශයෙන් ඉදිරිපත් කර තිබූ, මෙතෙක් හිමිකම් පාන්නකු ඉදිරිපත් නොවූ වාහන රාජසන්තක කර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා පියවර ගැනීමට සිදු වී ඇත.

එබැවින්, පහත විස්තර සඳහන් රථවාහන සම්බන්ධයෙන් හිමිකම් පාන්නකු සිටී නම් මෙම නිවේදනයේ දින සිට මාස 02ක් ඇතුළත හිමිකම් පෑමට අදාළ ලේඛන සමග දෙහිඅත්තකණ්ඩිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් වී දැනුම් දෙන ලෙස මෙයින් දන්වමි.

ඩබ්. එම්. එම්. අයි. වාසල,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
දෙහිඅත්තකණ්ඩිය.

*හිමිකම් නොපාන ලද වාහන විස්තර ලැයිස්තුව*

| *අනු. අංකය* | *නඩු අංකය* | *වාහන විස්තරය* |
|---|---|---|
| 01 | 15530 | චැසි අංක DDF 3 LG 80840 යතුරු පැදිය |
| 02 | 15213 | SP VB 0944 යතුරු පැදිය |
| 03 | 3996 | EP QG 4524 යතුරු පැදිය |
| 04 | 9615 | WP JM 6690 යතුරු පැදිය |
| 05 | 19645 | EP BCS 2090 යතුරු පැදිය |
| 06 | ඒ. ආර්. 499/18 | WP QX 2270 ත්‍රිරෝද රථය |
| 07 | 22432 | EP VK 2751 යතුරු පැදිය |
| 08 | ඒ. ආර්. 599/20 | EP MU 1223 යතුරු පැදිය |
| 09 | 16495 | EP TF 6297 යතුරු පැදිය |
| 10 | 18609 | අංක රහිත සෙන්ෆින්ග් 12 වර්ගයේ අත් ට්‍රැක්ටරය |
| 11 | 14389 | අංක අපැහැදිලි සීෆෑන්ග් වර්ගයේ අත් ට්‍රැක්ටරය |
| 12 | 14294 | සීරියල් අංක SSW 2436 දරන GN වර්ගයේ අත් ට්‍රැක්ටරය |
| 13 | 13843 | අංක රහිත බ්‍රවින් සීෆෑන්ග් වර්ගයේ රතුපාට අත් ට්‍රැක්ටරය |
| 14 | 14291 | GN 12 වර්ගයේ ෆාම් මාස්ටර් වර්ගයේ අත් ට්‍රැක්ටරය |
| 15 | 13603 | ලියාපදිංචි නොකල අත් ට්‍රැක්ටරය |
| 16 | 19485 | සීරියල් අංක EDP 51441-20058 එඩ්ග්‍රෝ සුපර් 12 වර්ගයේ අත් ට්‍රැක්ටරය |
| 17 | 16745 | සෙන්ෆින්ග් GN 12 වර්ගයේ අත් ට්‍රැක්ටරය |

04-873

# විවිධ දැන්වීම්

## ගණන් බේරා වසා දැමීමේ දැන්වීමයි

වාණිජ අධිකරණ බලය ක්‍රියාත්මක කරන බස්නාහිර පළාත් (කොළඹ දී පැවැත්වෙන) මහාධිකරණයේ (සිවිල්) දී ය

කොළඹ 02, වොක්ෂෝල් වීදිය, අංක 315, එයිට්කන් ස්පෙන්ස් ටවර්, 10 වැනි මහලෙහි පිහිටි මාස් කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ් පිළිබඳ ඉල්ලීමකි.

*නඩු අංකය* : HC *(සිවිල්)*/21/21/CO
*ස්වභාවය* : සමාගම් (ඈවර කිරීම්)

*සහ*

1939 ඈවර කිරීම් රීති සමග කියවිය යුතු 2007 අංක 07 දරන සමාගම් පනතේ XII කොටස යටතේ අධිකරණය මගින් ඈවර කිරීම සඳහා වූ ඉල්ලීමකි.

EZY ඩිස්ට්‍රිබියුශන් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 17, සමගි මාවත, බොරුපන පාර, රත්මලාන.

..........................*පෙත්සම්කරු.*

ඉහත නම් සඳහන් සමාගම වාණිජ අධිකරණ බලය ක්‍රියාත්මක කරන බස්නාහිර පළාත් (කොළඹ දී පැවැත්වෙන) මහාධිකරණයේ (සිවිල්) විසින් ගණන් බේරා වසා දැමීම සඳහා පෙත්සමක් රත්මලාන, බොරුපන පාර, සමගි මාවත, අංක 17 යන ලිපිනයේ ලියාපදිංචි කාර්යාලයේ පිහිටි EZY ඩිස්ට්‍රිබියුශන් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම විසින් වර්ෂ 2021ක් වූ මාර්තු මස 04 වැනි දින වාණිජ මහාධිකරණයට ඉදිරිපත් කරන ලද බවත්, එම පෙත්සම වර්ෂ 2021ක් වූ මැයි මස 25 වැනි දින අධිකරණය ඉදිරියේ විභාග කිරීමට විධාන කෙරුණ බවත්, එම පෙත්සමට අදාළ නියෝගයක් කිරීමට පක්ෂව හෝ විරුද්ධව කරුණු සැලකර සිටීමට අපේක්ෂා කරන එකී සමාගමේ ණය හිමියන් හෝ සහදායකයෙක් වේ නම් ඒ සඳහා තමාම හෝ සිය නීති උපදේශකවරයා හෝ නීතිඥවරයා මගින් එම විභාගය පවත්වන අවස්ථාවේ දී පෙනී සිටිය හැකි බවත්, එකී පෙත්සමේ පිටපතක් ලබා ගැනීම සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට එහි පිටපතක් අවශ්‍ය කරන එකී සමාගමේ යම් ණය හිමියෙකුට හෝ සහදායකයෙකුට පහත අත්සන් කරන අය විසින් සපයනු ලබන බවත්, මෙයින් දැනුම් දෙනු ලැබේ.

*අත්සන් කළේ.-*

තාරක සචීන්ද්‍ර ජයතිලක,
80/14, සිගේරා මාවත, මාදිවෙල, කෝට්ටේ.

***සටහන.-*** එකී පෙත්සම විභාග කරන අවස්ථාවේ දී ම පෙනී සිටීමට අදහස් කරන කිසිවෙකු වෙතත් එසේ කිරීමට අදහස් කරන බවට ලිඛිත නිවේදනයක් ඉහත නම් සඳහන් තාරක සචීන්ද්‍ර ජයතිලක වෙත ගෙනැවිත් භාරදිය යුතු හෝ තැපෑලෙන් එවිය යුතු වේ. එම නිවේදනයේ එම අයගේ නම හා ලිපිනය හෝ ව්‍යාපාරික ආයතනයක් නම් එම ව්‍යාපාරික ආයතනයේ නම හා ලිපිනය ද සඳහන් කොට එම අය විසින් හෝ එම ව්‍යාපාරික ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ හෝ නීතිඥවරයෙකු වෙතොත් ඔහු විසින් අත්සන් කොට ඉහත නම් සඳහන් අය වෙත වර්ෂ 2021 මැයි මස 24 වැනි දින පස්වරු 6.00ට හෝ ඊට පෙර ලැබෙන සේ ගෙනැවිත් භාරදිය යුතු ය. *නැතහොත්* එපරිදි තැපෑලෙන් එවිය යුතු ය.

තාරක සචීන්ද්‍ර ජයතිලක,
80/14, සිගේරා මාවත, මාදිවෙල, කෝට්ටේ.

04-792

## ප්‍රසිද්ධ ඉඩම් වෙන්දේසියයි

### කොළඹ වාණිජ මහාධිකරණයේ දී ය

කොළඹ 10, ටී. බී. ජායා මාවතේ, අංක 479 (කලින් අංක 48) දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය සහ හොරණ ශාඛා කාර්යාලයක් පවත්වාගෙන යන ලියාපදිංචි කර්යාලය සහ හොරණ ස්ථානයේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

*නඩු අංකය :* CHC 0044/2012/MR

*...........................පැමිණිලිකරු.*

*එදිරිව*

1. මහඅම්බලන්ගොඩ පතියන්දුවගේ සුනිල්,
2. පෝදාගොඩගේ දෝන ශ්‍රියානි,
   අංක 49/ඩී, පිටවල පාර, සච්සිරි උයන කුඹුර,
   ගෝනපල.

*නව ලිපිනය :*

අංක 34, සුදේරිස් සිල්වා මාවත, හොරණ සහ අංක 34/ඒ, සුදේරිස් සිල්වා මාවත, හොරණ.

*.............................විත්තිකරුවන්.*

වර්ෂ 2014ක් වූ පෙබරවාරි මස 26 වැනි දින ඉහත අංක දරන නඩුවේ ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය අනුව ඉහත නම් කර ඇති විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට මෙහි පහත පළවන උපල්බනයෙහි සවිස්තරව විස්තර කර තිබෙන ඉඩම් සහ ගොඩනැගිලි ද, ඒවාට අයත් සියලු අයිතිවාසිකම්, වරප්‍රසාද, පරවශතා සහ අනුබන්ධන ද ඒ දේපලවලට හෝ ඒවායින් ඒවා කෙරෙන් හෝ ඒවායේ සෑම කොටසකටම විත්තිකරුවන් සතු සියලු බූදල්, හිමිකම්, අයිතිවාසිකම්, ස්ථාවර සම්බන්ධතා හිමිකාරත්ව සහ ඉල්ලුම් යනාදිය ඉහත සඳහන් රු.4,561,041.93ක් වූ මුදල සහ ඒ සඳහා 2011 සැප්තැම්බර් මස 23 වැනි දින සිට සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තෙක් වර්ෂයකට 24% බැගින් පොළිය ද, ඉහත කී සී, සී1 සහ සී 2 යනුවෙන් ලකුණු කළ උකස් බැඳුම්කරයෙන් පදනම් කරගෙන එකතු කළ අය මත බදු (වැට් බදු) ද, සමග ගෙවීමට බැඳී යටත්ව පවතින බවට ආඥාවක් හා තීන්දු ප්‍රකාශ කරන ලදී. තීන්දු ප්‍රකාශයේ දින සිට මාස දෙකක් ඇතුළත රු. 4,561,041.93 යන මුදල් ප්‍රමාණය සහ ඒ සඳහා 2011 සැප්තැම්බර් මස 23 දින සිට වර්ෂයකට 24% බැගින් පොලිය හා ගාස්තු පැමිණිලිකරුට ගෙවන මෙන් විත්තිකරුවන්ට ගරු අධිකරණය විසින් ආඥාකරන ලෙස හා එසේ ගෙවීම් පැහැර හරිනු ලැබුවහොත් පළවන උපලේඛනයේ විස්තර කර තිබෙන ඉඩම් හා ගොඩනැගිලි දෙවන උපලේඛනයේ විස්තර කර ඇති මාර්ග අයිතියට යටත්ව පිස්කල්වරයා ලවා ගරු අධිකරණය නියම කර පත්කරනු ලබන බලය ලත් වෙන්දේසිකරුවකු ලවා එසේ නියම කරන විකුණුම් කොන්දේසි මත විකිණීමට ආඥාකොට තීන්දු ප්‍රකාශ කරන ලදී. එම පිස්කල්වරයාට/වෙන්දේසිකරුට පහත දැක්වෙන විධාන කර බලය දෙන ලෙසට එනම්,

එම ඉඩම් හා පරිශ්‍රය තක්සේරු වටිනාකමට විකිණීම සඳහා ප්‍රථමයෙන් ඉදිරිපත් කිරීමටත්, එම තක්සේරු වටිනාකමට මිලදී ගැනීම සඳහා ලංසු තබන්නන් නොමැති වුවහොත් කොමිසම නිකුත් කරන අවස්ථාවේ දී තීන්දු ප්‍රකාශය යටතේ අයවිය යුතු මුදලට විකිණීම සඳහා ඉදිරිපත් කරන ලෙසත්, එම විකිණීමේදී ද ලංසුකරුවන් නොමැති වුවහොත් ඉන් අනතුරුව ඉහලම ලංසුකරුට හෝ ලංසුකරුවන්ට විකිණීම සඳහාත් බලය දෙන ලෙස ආඥාකොට ප්‍රකාශ කරන ලදී. එම ඉඩම් පරිශ්‍රය තක්සේරු වටිනාකමට විකිණීම සඳහා ප්‍රථමයෙන් ඉදිරිපත් කිරීමට උකස් පනතේ 52 (1) වගන්තිය යටතේ නියමයක් කර තිබෙන අවස්ථාවක එම පළමු විකිණීමේ දී ඉදිරිපත් වූ ඉහළම ලංසුව උකස් පනතේ 51(3) වගන්තිය යටතේ නියම කරනු ලැබූ තක්සේරු වටිනාකමට වඩා අඩු වුවහොත්, එම ඉඩම ප්‍රථම විකිණීමේ දී නොවිකිණිය යුතු බවට සහ එවැනි අවස්ථාවක එම ඉඩම දෙවන වරක ද විකිණීමක් කළයුතු බවට සහ එම දෙවන විකිණීමේ දී ද එම තක්සේරු වටිනාකමට මිලදී ගැනීම සඳහා ගැනුම්කරුවන් නොමැති වුවහොත් කොමිසම නිකුත් කළ අවස්ථාවේ අයවිය යුතුව තිබුණු මුදලට විකිණීම සඳහා ඉදිරිපත් කරන ලෙසත්, එම විකිණීමේ දී ද ලංසුකරුවන් නොමැති වුවහොත් ඉන් අනතුරුව උකස් පනතේ 50(4) වගන්තියට අනුකූලව ඊළඟ ඉහළම ලංසුකරුට හෝ ලංසුකරුවන්ට විකිණීම සඳහා ඉදිරිපත් කිරීමටත් ආඥාකොට තීන්දු ප්‍රකාශ කරන ලදී. එකී ඉඩම් සහ ගොඩනැගිලි මිලදී ගැනීම සඳහා ලංසු තැබීමට පැමිණිලිකරුට හෝ පැමිණිලිකරු වෙනුවෙන් වෙනත් තැනැත්තෙකුට ඉඩ දීමට හා පැමිණිලිකරු ගැනුම්කරු බවට පත්වුවහොත් පැමිණිලිකරුගේ හිමිකම්පෑමේ හා ගාස්තුවල ප්‍රමාණය දක්වා පැමිණිලිකරුට බැරවාසි දීමටත්, ආඥාකොට තීන්දු ප්‍රකාශ කරන ලදී. එම විකිණීමේ ගැණුම්කරු හෝ ගැණුම්කරුවන් විකුණුම් කොන්දේසි අනුව ක්‍රියාකල පසුව ගැණුම්කරු පැමිණිලිකරු නම් පැමිණිලිකරුට ඉඩහරින

ලද බැරවාසිය අනුමත කරන අධිකරණ ආඥාවක් ඉදිරිපත් කළ පසුව හා ගැණුම්කරු හෝ ගැණුම්කරුවන් තුන්වන පාර්ශ්වයන් හෝ පාර්ශ්වකරුවන් වේ නම් ඔවුන් විසින් ගැනුම් මිල නිසි පරිදි අධිකරණයේ තැන්පත් කර තිබෙන බවට අධිකරණ ආඥාවක් හෝ අධිකරණ ආඥා ඉදිරිපත් කළ පසුව ගැනුම්කරු හෝ ගැණුම්කරුවන් නමට නීතිය අනුව නිසි ආකෘතියෙහි වූ පැවරුම්කරයක් හෝ පැවරුම්කර ලියා අත්සන් කර දීමටත්, පිස්කල්වරයාට/වෙන්දේසිකරුට නියම කර බලය දෙන ලෙස ආඥකොට තීන්දු ප්‍රකාශ කරන ලදී. ඉහත කී පරිදි විකුණන ලද උකස් දේපලෙහි නිරවුල් හා හිස් සන්තකය එය මිලදී ගත් ගැනුම්කරුට හෝ ගැණුම්කරුවන්ට භාරදෙන මෙන් පිස්කල්වරයාට විධාන කරන ලෙස ආඥකොට තීන්දු ප්‍රකාශ කරන ලදී. විකිණීමෙන් ලැබෙන මුදල් පැමිණිලිකරුගේ හිමිකම් පෑම පොළිය හා ගාස්තු ගෙවීම සඳහා යොදන ලෙස ආඥකොට තීන්දු ප්‍රකාශ කරන ලදී.

අධිකරණය විසින් නම් කරනු ලැබූ ආඥවක දී හැර මේ අධිකාරය ක්‍රියාවේ යෙදවීම නොනවත්වන ලෙස මෙයින් වැඩිදුරටත් විධානය කරනු ලැබූ හෙයින්, එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති විකිණීම සඳහා වූ අධිකාරි පත්‍රයේ බලය පිට මා විසින් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපල වූ,

පර්චස් 13.93ක් වූ ''කහටගහවත්ත *හෙවත්* කහටගහකනත්ත'' යනුවෙන් හඳුන්වන ඉඩම් කැබැල්ල හා ඒ මත පිහිටි ගොඩනැගිලි හා වෙනත් සියලු දේ වර්ෂ 2021ක් වූ මැයි මස 22 වැනි දින පෙ. ව. 10.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

*පිවිසුම.-*

මේ සඳහා ප්‍රවේශය හොරණ පොකුණුවිට සිට කොළඹ මාර්ගයේ කුඹුක හන්දියට පැමිණ වමට ඇති ගැලනිගම මාර්ගයේ මීටර් 300ක් පමණ ගියවිට දකුණට ඇති පිටිවල පාරේ මීටර් 200ක් පමණ ගිය පසු පාරෙන් දකුණු අත පැත්තේ මෙම දේපල හමුවෙනු ඇත.

*ගෙවීමේ ක්‍රමය.-*

වෙන්දේසිය අවසන් වූ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය : (චෙක්පත් භාරගනු නොලැබේ.)

1. විකුණුම් මිලෙන් 25% (සියයට විසිපහක්),
2. වෙන්දේසිකරුගේ වෘත්තීය ගාස්තු (ගැනුම් මිලෙන්) 2.5% (සියයට දෙකයි දශම පහයි),
3. සියලුම ප්‍රචාරක ගාස්තු,
4. මුද්දර ගාස්තු,
5. ලිපිකරු හා සෝෂක ගාස්තු,
6. ප්‍රාදේශීය සභා ගස්තු 1% (සියයට එකක්),
7. නොතාරිස් ගාස්තු,
8. පළාත් පාලන ආයතනයන් විසින් පනවනු ලැබූ වෙනත් බදු ද ආදිය,
9. ගැණුම් මිලෙන් පළමුවන රු. 7,500ට රු. 150ක් ද, ඊට අමතරව ලැබෙන සෑම රු. 1,000/-ටම රු. 5/- බැගින් වූ අධිකරණයට ගෙවිය යුතු ගාස්තු ද, ඉතිරි 75%ක (සියයට හැත්තෑපහක්) මුදල දින 30ක් ඇතුලත කොළඹ වානිජ මහාධිකරණයේ නඩු අංක CHC 0044/2012/MR දරන නඩුවේ බැරට තැන්පත් කළ යුතු අතර එසේ ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත් මුලින් තැන්පත් කරන ලද මුදල් ආපසු නොගෙවන අතර, එකී දේපල නැවත වෙන්දේසියේ තැබීමට ක්‍රියා කරනු ඇත.

විමසීම් හා අදාල ඔප්පු ලේඛන පරීක්ෂාව සඳහා හමුවන්න.

අධිකරණයේ අණ පරිදි,

අජිත් දසනායක,
උසාවි කොමසාරිස්/සාමවිනිසුරු (මුළු දිවයිනටම),
බලයලත් වෙන්දේසිකරු සහ තක්සේරුකරු.

04-872

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.